පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව- සතිපාසල

සතිය - 5

විෂය:- ව්‍යාපාර හා ගිණුම්කරන අධ්‍යයනය

ශ්‍රේණිය :- 11

Prepared by - කලාප අධ්‍යාපන කාර්යාලය, කෑගල්ල

02. i. අ). අලෙවිකරණය යනු කුමක්ද?

ආ). අලෙවිකරණ මිශ්‍රයේ නිෂ්පාදිතය යක විචල්‍යයට ඇතුළත් වන අයිතම දෙකක් ලියන්න.

(ලකුණු 02)

ii. පහත සඳහන් ප්‍රකාශ සත්‍ය/ අසත්‍ය යන්න ලියා දක්වන්න.

අ). සීමිත සම්පත් වලින් උපරිම ප්‍රයෝජන ගැනීම සඳහා ව්‍යාපාරයකට කළමනාකරණය අවශ්‍ය වේ. ( )

ආ). ව්‍යාපාරයේ අරමුණු තීරණය කිරීම හා ඒවා ඉටුකර සඳහා සුදුසු ක්‍රියා මාර්ග තීරණය කිරීම සම්බන්ධ ක්‍රියාවලිය සැලසුම්කරණයයි. ( )

ඉ). ව්‍යාපාරයකට වඩාත් අකර්ශනීය ලෙස මෙන්ම ලාභදායී ලෙස තෘප්තිමත් කළ හැකි පාරිභෝගික කොටස ඉලක්ක වෙළඳපල වේ. ( )

ඊ). අලෙවි මිශ්‍රයේ විචල්‍යයන් අතරින් ව්‍යාපාරයට ආදායම ලබා දෙන්නේ ප්‍රවර්ධන විච- ල්‍ය මගිනි. ( )

iii. සමාගමක් විසින් ඉහළ පොෂණ ගුණයෙන් යුත් බිස්කට් වර්ගයක් නිෂ්පාදනය කිරීමට තීරණය කළ අතර ඒ සඳහා නවීන තාක්ෂණයෙන් යුතු යන්ත්‍රයක් මිල දී ගන්නා ලදි.නිෂ්පාදන ක්‍රියාවලියේ සෑම අවස්ථාවකදීම තත්ත්ව පාලක විසින් නිශ්පාදිතයේ ගුණාත්මකභාවය පරීක්ෂා කෙරෙන අතර,නිශ්පාදන කළමණාකරු ඔහුට අවශ්‍ය උපදෙස් ලබා දේ.

- කළමනාකරණ කාර්යය 4 දක්වා, එම එක් එක් කාර්යය සඳහා නිදසුන් ඉහත සිද්ධිය ඇසුරෙන් තොරා පහත ඇකාරයේ වගුවක සඳහන් කරන්න.

| කළමණාකරණ කාර්යය | සිද්ධියේ සඳහන් නිදසුන |
|---|---|
| 01. | |
| 02. | |
| 03 | |
| 04. | |

(ලකුණු 02)

iv. ව්‍යාපාරයක අලෙවිකරුවෙකු නිශ්පාදිතයක් හඳුන්වා දෙමින් කළ ප්‍රකාශයක් පහත දැක්වේ.”උණුසුම රඳවා ගත හැකි නිල් පැහැති කව කෑම ඇසුරුමෙහි පිරිවැය රු. 100 කි. පිරිවැය 10% ක ලාභාන්තිකයක් සහිතව මිල නියම කිරීමටත්,අලෙවි ප්‍රවර්ධකයින් මගින් නගරයේ පාසල් අසල මූලික හඳුන්වා දීම සිදු කිරීමටත් තීරණය කර ඇත. ”

අ). ඉහත ප්‍රකාශයේ ඇතුළත් අලෙවිකරණ මිශ්‍රයේ විචල්‍ය වන නිෂ්පාදිනය, මිල , ස්ථානය හා ප්‍රවර්ධනය සඳහා නිදසුන බැගින් ලියන්න.

ආ). ඉහත ප්‍රකාශයේ ඇතුළත් සැලසුම්කරණයට අදාළ කාරයයන් සඳහා නිදසුන බැගින් ලියන්න.

(ලකුණු 02)

02. i. අ). 2019 O/L (04).i. අ, ආ

ii.අ). 2017 O/L (04).ii. ඉ

ආ). 2016 O/L (04).ii. ඊ

ඉ). 2018 O/L (04).ii. ආ / 2016 O/L (04).ii. ඊ

iii. 2016 O/L (04).iii

iv. 2019 O/L (04).iv